දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 ප්‍රථම වර පරීක්ෂණය - 2018 ජූලි/අගෝස්තු
Bachelor of Arts General (External) Degree Part II Regular Examination 2015 – July/August 2018

සිංසා 3.1 - සම්භාව්‍ය සිංහල ගද්‍ය කාව්‍යය
# SLG 3.1 - Classical Sinhala Prose

කාලය පැය තුන යි

පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
(නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු විය හැකි ය)

---

01. පහත දැක්වෙන ඡේද වත්මන් ලිහිල් බසින් ලියන්න. අංකිත පදවලට විවරණ සපයන්න.

(අ) මහ තෙරුන් කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්සු ඔවුන් දැකැ වෙවුලත් මැ යැ. පලත් මැ යැ. දොරපියා ලත් මැ යැ. ඇතැම්හු අඟුල්මල් නම අසමින් මැ පලා වලට හො වදිති. ගෙට වැද දොර පියා ලා අගුළු හො ගන්ති. පලා නොයා හෙන්නාහු පිට් පෑ සිටුති. මහතෙරහු ළුවක් හඹු දු කෙණෙස්සක් බතු දු නො ලැබෙති. අහරින් ක්ලාන්ත වෙති. අහර නොලබන්නාහු "නුවර නම් සාධාරණයැ"යි නුවරට වදිති. යම් දොරෙකින් වන්හු ද, එහි මිනිස්සු "අඟුල්මල් අය"යි කළ දහස් බිඳිමින් පලත්. එක් දවසක් අඟුල්මල් මහතෙරහු පෙරවරු පා සිවුරු ගෙනැ සැවැත් නුවර වැද, සපදන්සැරි වන බැවින්, ගෙපිළිවෙළින් කෙණෙසි අහර සිඟන්නාහු මූඪගර්භ වැ නොවැදිය හෙන මාගමක දැකැ කරුණායෙන් කම්පිත වූහු. ඔවුන් පෙරැ එකක්හු ඌනූ දහසක් මිනිසුන් මරන්නානට එක දවසකුදු කුළුණු නො උපන. මූඪගර්භ මාගම දුටු පමණින් කුළුණු කිසෙ උපන යත්, පැවිජි බලයෙන් උපන්.

(අමාවතුර, අඟුල්මල් දමනය, කෝදාගොඩ ඤාණාලෝක හිමි සංස්.)

(ආ) මෙසේ පැතිරි සවනක් ඝන බුදු රසින් මුළු ලොවැ සදම්ව් වඩුත් වඩුත්, නුවර රසින් සැදෙත් සැදෙත්, පිල් සත් විදහා ගෙයි ගෙයි මොනරුන් නටත් නටත්, මැදිරියෙහි හුන් ගිරා සැළලිහිණි ආදී පක්ෂීන් පියා පැහැරැ හඬත් හඬත්, වීණා, වේණු, මිහිඟු බෙර ආදී ගැසුවන් නැතිවැ තම තමා මැ හඬත් හඬත්, හන් පළන් ආභරණ තම තමා මැ කිංකිණික ජාල සෙ මධුරනාද පවත්වත් පවත්වත්, මෙ සලකුණින් වැඩි දැ වනැ'යි දික් කළ ඇසට යුගාන්තවාතයෙන් ඉපිලැ ආකාශයට පැනැ නැඟි සත් රුවන් මෙර සෙ, ස්වාමිදරුවාණෝ එක විටැ මැ පැනී ගියා හ. ඇස් දල්වී ගියෙ, කට දල්වී ගියෙ, අක්පයින් සිටිනට වන් හ. 'සාධූ සාධූ'යි කියන්නට වන් හ. සතුටු කඳුළු පරහන්නට වන් හ. හිසැ සිටැ සර්වාංගයෙහි රෝම තාක් හැප්සෙන්නට වන. සන්ධ්‍යාවලා සෙ රත් වූ පලසින් වසා දිව්‍ය වීථියට යතාලූ ඓරාවන නම් මතැත්හු සෙ වඩනට වන් හ. හෙන මහ තරුවක් පස්සෙහි අනූ වැ තිබූ රස් කඳක් සෙ ඒ මහණ පිරිස මුළු ලො ඇස් හයන්නට වන් හ.

(බුත්සරණ, නාලාගිරි දමනය, ලබුගම ලංකානන්ද හිමි සංස්.)

(ඇ) දෙවතාවාණෝ මෙසේ අවවාද කොටලා තමන්ගේ දෙව්ලොවට ම ගියහ. බමුණාණෝ ගෙට ගොසින් බැමිණිණියන් බණවාලා 'පින්වත, මහණගොයුම්හු පවරා ගෙනවුත් දන් වළඳවාලා ප්‍රශ්න විචාරමි. දන් සරහ'යි කියා සම්මත කොටලා වෙහෙරට ගොසින් බුදුන් නොවැඳ ම සාදසාමීචි ලෙස කථාත් නොකොට ම <u>එකත්පස් ව සිට</u> 'භවත් ගෞතමයෙනි, භික්ෂුසංඝයා හා සමඟ අද අපගේ ආරාධනා නිසා අපගේ ගෙයිදී වැළඳුවමැනවැ'යි කිවුය. බුදුහුත් බොහෝ ප්‍රයොජන සලකා ආරාධනාවේ අරුමයක් නැතත් ඉවසා වදාළසේක. බමුණාණෝ බුදුන් ඉවසා වදාළ නියාව දැන වහා ගෙට ගොසින් නැතක් දවස් නියඟ කොට තබාලා බිම තෙමා වස්නා මහ වැස්සක් මෙන් නැතක් කලක් ම තමන් කළවිරූ දෙයක් නොවන හෙයින් අරුමයක් සේ දෙන දන යහපත් කොට සැරහුය. බුදුරජුන්වහන්සේ ද තකත් තරු පිරිවරා නික්මුණු සඳ පරිද්දෙන් මහණගණා පිරිවරා බමුණාණන්ගේ ගෙට වැඩ පනවනලද බුදුහස්නෙහි යුගඳුරු මුදුනෙහි වොරජනා ළහිරුමඬලක් මෙන් වැඩහුන්සේක. භික්ෂුසංඝයාවහන්සේ ද රන් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත්නෙළුම් වනයක් මෙන් වැඩහුන්සේක. බමුණාණෝ ද බුදුපාමොක් සංඝයාවහන්සේ සිය අතින් සකස්කොට වැළඳූය. එදවස් මිථ්‍යාදෘෂ්ටිකයන්ගෙනුත් සම්‍යක්දෘෂ්ටිකයන්ගෙනුත් බොහෝදෙන රැස් වූය. මේ දෙපක්ෂයෙන් මිථ්‍යාදෘෂ්ටිකයෝ 'මේ බමුණාණන් ආරාධනා කොට ශ්‍රමණභවත් ගෞතමයන් ගෙට ම කෙළේ නම් හුදක් දන් දෙන්ට අමුතු නොවෙයි. ප්‍රශ්න විචාරා වෙහෙස දෙන්ට ය. ශ්‍රමණභවත් ගෞතමයන්ට වන සිලගු බලම්හ' රැස් වූය. සම්‍යක්දෘෂ්ටිකයෝ 'අද වූකලී මේ සම්‍යක් සම්බුද්ධ නැමැති සූර්‍යයාතෙමේ සැදැහැ නැති බමුණාණන්ගේ මිථ්‍යාදෘෂ්ටි නැමැති අඳුරු හරවනු නිසා දෙශනා නැමැති ආලොකයත් ශරීරාලොකයත්

(සද්ධර්මරත්නාවලිය, සංස්. ප්‍රාචීන භාෂෝපකාර සමාගම)

(ඈ) එබස් අසා කුස රජ්ජුරුවෝ මනොඥවූ අංග ප්‍රත්‍යංගාදී ස්ත්‍රී සෞභාග්‍යයෙන් යුක්තවූ ප්‍රභාවතිනි අනෙක කොටි චාටු නාටක ස්ත්‍රීන් හා අනන්ත සාමන්ත චක්‍ර මෞලිමාලලාලිත පාද පීඨ ඇති රාජ්‍යශ්‍රීද හැර පෙර තොප කෙරෙහි බැඳුනු සිතින් නොරටට පැමිණ දුක් විඳිමින් තොප හා සමග ප්‍රෙමාන්විතවූ කථා සම්භාෂණ මාත්‍රයකුත් නොලද්දාවූ මම භාවභාව ලීලාකටාක්ෂ නිරීක්ෂණ මන්‍දස්මිත මධු මධුරභාෂිතාදී සෞභාග්‍යයෙන් යුක්ත කොමලාංග ඇති තොපගේ ළය ගලකින් කරනලදැයි සිතමි. තවද ප්‍රභාවතිනි තෙපි යම් පමණ කලක් කොපයෙන් රූෂ්ටව බලන්නීද ඒතාක් මදු රජ්ජුරුවන්ගේ මේ භවනයෙහි දුක් විඳිමින් අරක්කැමිව වාසය කෙරෙමි. යම් කලෙක්හි සිනා පහළකර සනිග්ධවූ නිරීක්ෂණයෙන් සතුටුව බලන්නෙහිද එකල චිත්ත සන්තාපයන් දුරුකොට රාජ්‍යශ්‍රීයට පැමිණියාක් මෙන් වෙමි. එහෙයින් සොඳුර මෙතැන් පටන් මෙබඳුවූ තදබදකම් නොකරව යනාදීන් යාච්ඤාව කීවාහුය. එබස් අසා ප්‍රභාවතී තොම මෙතෙම වඳුරු වලාවෙහි බැඳුනු වානරයක්හු පරිද්දෙන් මා කෙරේ ඉතා ශක්තව කියන්නේය. උපදෙසකින් බොරුවක් කියා මෙයින් නික්මවමි සිතා මහරජ කුස රජ්ජුරුවන් වහන්සේ මට ස්වාමිවන සේක්ද නොවන සේක්දැයි නිමිත්ත විචාලතෙන ඒ <u>නිමිත්ත පාඨකයෝ</u> නුඹ වහන්සේ සත්කඩක් කොට කැපුවත් උන්වහන්සේට අග මෙහෙසුන් වන්නේ නැතැයි තරයේම කිවුය. එහෙයින් නොයෙක් කාරණයෙන් නොකමැතිවූ මා නිසා දුක් නොවිඳ නුඹවහන්සේගේ රටටම පලාගිය මැනවැයි කිවුය.

(පන්සිය පනස් ජාතක පොත, සංස්. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය)

(ලකුණු 28 යි)

02. ගුරුළුගෝමී තම ග්‍රන්ථ පරමාර්ථයට අනුකූලව ම ‘පුරිසදම්මසාරථී’ බුදු ගුණය විචිත්‍රවත්ව වර්ණනා කළ අයුරු, අමාවතුරෙහි අඟුල්මල් දමන කථාව නිදසුන් කොට ගනිමින් විග්‍රහ කරන්න.

03. “විද්‍යාචක්‍රවර්තිගේ කථා කලාවෙහි සුවිශේෂත්වය, හුදෙක් බුදු රදුන් කෙරෙහි අසීමිත භක්තියක් ජනනය කිරීමේ ප්‍රයත්නයකැයි කිව හැකි නමුදු, එතුමන්ගේ අපූර්ව වර්ණනා ශක්තිය එහිදී වඩාත් කැපී පෙනේ ” බුත්සරණ ආශ්‍රිතව අදාළ නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

04. දන් දීමේ පරමාදර්ශී චරිතය ලෙසින් වෙස්සන්තර රජුගේ චරිතය ද, ලෞකික බැඳීම්වල දැඩි බව හා එහි ශෝක ජනක අත්දැකීම් මද්‍රී බිසව හා දරු දෙදෙනාගේ චරිතවලින් ද නිරූපණය කොට ඇති ආකාරය බුත්සරණේ ‘වෙසතුරු කථා පුවත’ ඇසුරෙන් විමසන්න.

05. සද්ධර්මරත්නාවලියෙහි උපයුක්ත ගද්‍ය රීතිය සනිදර්ශනාත්මක ව පැහැදිලි කරන්න.

06. ජාතක කථා රචකයා සම්මත ආකෘතියක පිහිටමින් සමාජ සංශෝධනය සිදු කළ ආකාරය නිර්දිෂ්ට කථා ඇසුරෙන් පැහැදිලි කරන්න.

(02 සිට 06 දක්වා ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)

**********************************